සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

යුරෝපා ඉතිහාසය II (II කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி II)
History of Europe II (Part II)

25 B | S | II

යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

උපදෙස්:

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.

* **පළමුවන** ප්‍රශ්නයටත් **B** හා **C** කොටස්වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) මධ්‍යධරණී මුහුද — (ii) ක්‍රීට — (iii) රෝමය

(iv) ඩැනියුබ් ගඟ — (v) කැස්පියන් මුහුද — (vi) පෝ ගඟ

(vii) බොස්පරස් සමුද්‍ර සන්ධිය — (viii) පෝලන්තය — (ix) ජිනීවා

(x) නෝර්වේ — (xi) ලිවර්පූල් — (xii) ඩැන්සිග්

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්)

## B කොටස

2. පෞර රාජ්‍යයක සිට විශාල අධිරාජ්‍යයක් දක්වා රෝම බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 16 යි)

3. "පුනරුදය මූලික වශයෙන් සංස්කෘතික ව්‍යාපාරයකි."

(i) පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) පුනරුදයට අනුග්‍රහ දැක්වූවන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) පුනරුදය ඇතිවීමට තුඩුදුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 05 යි)

(iv) කලාව, භාෂා සහ සාහිත්‍යය යන ක්ෂේත්‍රවල පුනරුදයේ කාර්ය සිද්ධීන් කෙරෙහි අවධානය යොමු කරමින් සංස්කෘතික ව්‍යාපාරයක් ලෙස එහි ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි)

4. පහත දැක්වෙන අංග කෙරෙහි අවධානය යොමු කරමින් අමෙරිකන් විප්ලවය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරන්න.

(i) විප්ලවය ඇති වූ පසුබිම (ලකුණු 08 යි)

(ii) ඉන් උද්ගත වූ ප්‍රතිඵල (ලකුණු 08 යි)

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ග්‍රීක ආගම හා දර්ශනය

(ii) හත්වන හෙන්රි **හෝ** අටවන හෙන්රි **හෝ** යටතේ එංගලන්තය

(iii) එංගලන්තයේ කාර්මික විප්ලවය ඇති වූ පසුබිම

(iv) නැපෝලියන් බොනපාට්ගේ දේශීය ප්‍රතිපත්තිය

(එක් කෙටි සටහනකට ලකුණු **08** බැගින්)

[අටවැනි පිටුව බලන්න.

## C කොටස

6. වික්ටර් එමැනුවෙල් රජු, කැවූර් හා ගැරිබෝල්ඩි යන්නවුන්ගේ භූමිකා ඇසුරින්, 1848 සිට 1870 දක්වා වූ කාලය තුළ ඉතාලිය එක්සත් කිරීමේ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

7. " 1917 බොල්ෂෙවික් විප්ලවය රුසියාව තුළ දිගු කාලීන වෙනස්වීම ඇති කළේ ය."
   (i) 1917 වන විට රුසියාව පාලනය කළ අවසාන සාර්වරයා නම් කරන්න. (ලකුණු 01 යි)
   (ii) බොල්ෂෙවික් විප්ලවයේ නායකයන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)
   (iii) බොල්ෂෙවික්වරුන්ට රුසියාවේ බලය අල්ලා ගැනීමට තුඩුදුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)
   (iv) 1917 බොල්ෂෙවික් විප්ලවය රුසියාව තුළ දිගුකාලීන වෙනස්වීම් ඇති කළ ආකාරය පරීක්ෂා කරන්න. (ලකුණු 09 යි)

8. අන්තර් යුද්ධ සමය තුළ ජර්මනියෙහි නට්සිවාදය නැගී ඒමට තුඩු දුන් ප්‍රධාන සාධක විග්‍රහ කරන්න. (ලකුණු 16 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   (i) වියනා සම්මේලනය
   (ii) බිස්මාර්ක්
   (iii) බෙනිටෝ මුසෝලිනි
   (iv) 1980 තෙක් සාම සාධක ආයතනයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ භූමිකාව

(ලකුණු 08 × 2 = 16 යි)

* * *